සම්මානයෙනුත් 1995 දී වරෙන්තු නාට්‍යය සඳහා හොඳම සහාය නළුවා සම්මානයෙනුත් පුද ලැබුවා. පුංචි තිරය සඳහා ඔහු දුන් දායකත්වය ඇගයීමට ලක් වුණේ දෙපත් නයි ටෙලිනාට්‍යයේ රංගනය සඳහා 1994 වසරේ හොඳම ටෙලි නාට්‍ය සහාය නළුවා වශයෙන් සම්මානයට පාත්‍ර වීමෙන්.

ඉඩ ලැබෙන සෑම විටම මෙල්බන් ශ්‍රී ලාංකික ප්‍රජාවට මෙහෙයක් කරන්නට වෙහෙසෙන ශ්‍රීනාත් උතුරු වික්ටෝරියා ප්‍රදේශයේ හියුම් සිටි කවුන්සිලය හා එක්ව අපේ දරුද දැරියනට සිංහලෙන් කතන්දර කියා දීමේ වැඩ සටහනක් පසුගිය කාලයේ ආරම්භ කළා. ක්රේගිබර්න් පුස්තකාලයේ දී පැවැත්වෙන මේ වැඩ සටහන කොයි තරම් ජනප්‍රිය වුවා ද යත් හියුම් සිටි කවුන්සිලය විවිධ භාෂාවන්ගෙන් ක්‍රියාත්මක කරන එවැනි වැඩ සටහන් අතරින් වැඩිම සහභාගීත්වයක් ඇති වැඩ සටහන මෙය බවට පත්ව තිබෙනවා. මේ ජනප්‍රියත්වය නිසාම මේ වැඩ සටහන බ්‍රෝඩ්මෙඩෝස් පුස්තකාලයේදීත් පවත්වන්නට හියුම් සිටි කවුන්සිලයේ හිලධාරීන් දැන් ඔහුට ආරාධනා කර තිබෙනවා.

මේ වැඩ සටහනේ දී ළමා කතන්දර, ළමා ගීත, මපරි ඇතුළු විවිධ ක්‍රියාකාරකම් රැසක් ශ්‍රීනාත් ඉදිරිපත් කරනවා. අපේ දරුවනට අපේ කම පිළිබඳ හැඟීමක් මේ වැඩසටහන් තුළින් ලබාදෙන්නට හැකි යයි ශ්‍රීනාත් විශ්වාස කරනවා. වයස් සීමාවකින් තොරව ඕනෑම දරුවෙකුට මේ වැඩසටහනට සහභාගිවෙන්න පුළුවන්.

ඉදිරි වැඩ සටහන් ක්රේගිබර්න් පුස්තකාලයේදී නොවැ 10 දෙසැ 8 පනවාරි 10 පෙබරවාරි 9 යන දිනවල දී පැවැත්වෙන අතර බ්‍රෝඩ්මෙඩෝස් පුස්තකාලයේ වැඩ සටහන දෙසැම්බර් 12 දා පව 6 ට ආරම්භ වෙනවා.

ඉදිරියේදී මේ වැඩ සටහන මෙල්බන් හි වෙනත් ප්‍රදේශ දක්වා ව්‍යාප්ත කරන්නත ඔහු අදහස් කරනවා. ඒ සම්බන්ධ අපේ දරුවනට නාට්‍ය හා රංග කලාව පිළිබඳ අවබෝධයක් ලබා දෙන්නත් ඔවුන් සමඟ ළමා නාට්‍යයක් ඉදිරිපත් කරන්නටත් ශ්‍රීනාත් සැළසුම් කරමින් සිටිනවා. සන්නස කාර්ය මණ්ඩලයේ උද්යෝගිමත් ලේඛකයකු වන ශ්‍රීනාත්ගේ මේ නව වැඩ සටහනට අපේ සුබ පැතුම්.

ඉදිරියේදී පවත්වන්න බලාපොරොත්තු වෙනවාද?

ඔව්. ඔව්. ඒ ප්‍රසංගය අපි පවත්වනවා.

දින වකවානු එහෙම?

දැන්ම කියන්න බැහැ. මේ වාතාවරණය පහව ගිය දවසක.

පිරිවරවල පැවැත්වූ ප්‍රසංග එහෙම කොහොමද?

බොහෝ බටහිර රටවල මමත් මගේ බිරිඳ චරිතාත් ප්‍රසංග පවත්වලා තියෙනවා. එයිනුත් මේ වසරේ මාර්තුවල ඕස්ට්‍රේලියාවේ ඔපෙරා හවුස් හි පැවැත්වූ ප්‍රසංගය විශේෂයි. මොකද බටහිර සංගීත ශිල්පීන්ට පවා එහි ප්‍රසංග පැවැත්වීම් සිහිනයක්. එවැනි ගායකයකුට ඉහළ පිළිගැනීමක් තියෙනවා. සංගීතය හදාරණ කාලෙදීත් ඔපෙරා හවුස් ගැන ඉගෙන ගෙන තියෙනවා. එදා ඒක සිහිනයක්. සිහිනයක් සැබෑවීම කෙනෙකුට කොතරම් සුවිශේෂද? අනෙක ඒ ප්‍රසංගය පැවැත්වුණෙත් සුනාමියෙන් අවතැන් වුණු ශ්‍රී ලාංකීය ළමුන් 500 කට කැපකරු දායකත්වය ලබන්නට ආධාර ලබා ගන්නටයි.

කොහොමද විදෙස් රටවල සිටින ශ්‍රී ලාංකිකයන්ගේ එකමුතු බව?

පිටරටකට ගියාම තමයි අපේ රටේ අගය දැනෙන්නේ. බොහෝ ශ්‍රී ලාංකිකයින් හරිම එකමුතුයි. නමුත් ඔවුන් අතර ලාංකීයත්වයට ගරහන අයත් නැතිවම නොවෙයි. ශ්‍රී ලාංකික කලාකරුවන්ගේ ප්‍රසංග බලන්න එන එකත් මදි පුංචිකමක් හැරියොට සලකන අයත් ඉන්නවා. සමහර කලාකරුවන් ගෙනුත් අකධයුතුකම් සිදුවෙනවා. මේ නිසා ශ්‍රී ලාංකීය කලාකරුවන් අපකීර්තියට පත්වන අවස්ථා වනුත් තියෙනවා. ඒ අතින් ගත්තොත් ශ්‍රී ලාංකිකයන් කියන්න අකමැති අය ඒ රටවල හිඳීම අරුමයකුත් නැහැ.

සාකච්ඡා කළේ

පණ්ඩුක සමරසේකර

විමලරත්න කුමාරගම නැවත කියැවීම 6

රන්න ශ්‍රී විජේසිංහ

නිවැරදි ඥානයත් දැනුමත් ප්‍රකෘතියට හෝ මිනිසාට හෝ සතුරු නොවන වග හෙළිදරව් වන විට කුමාරගම අප හැර ගොසිනි.

ඉහත කවි වලින් කුමාරගමගේ විචාර සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් නොලැබෙනත්, 'කවිය භෞතික ලෝකයේ මෙන් ම ආධ්‍යාත්මික ලෝකයේද එකතුවක්ය යන්නත්, අල්විස් පෙරේරා ගේ කවියේ වූ දිළින්දන් ගේ ජීවිත හෙළිදරව්ව පිළිබඳ කැරුණුත් වැදගත්ය. කුමාරගම කවියා මෙන් ම කොළඹ යුගයේ සෙසු ප්‍රමුඛ කවීන් ද අතර සිදුවූ ලිපි හුවමාරුවෙන්, ඔවුනොවුන් ලැබූ ප්‍රතිපෝෂණය ඉමගින් වූ බව පෙනේ. ඔවුහු තමන් ගේ මෙන්ම සෙසු අයගේ කවිද රස විඳිමින් මත පළ කරමින් ඒ පිළිබඳ ලිපි මගින් අදහස් හුවමාරු කරගත්හ.

නිවහල් කම එක කවියකු පවා	නැතී
හැම රට වහල් බව සඳහට ලබා	ඇතී
කිවිඳුගෙ නිදහසෙහි අඬු දඬු කඩා	ඇතී
රටවල සිරගෙවල ඉඩ කඩ කුඩා	වෙතී

යනුවෙන්, කවියකුගේ ස්වාධීනතාවත්, ස්වාධීනතාවට සීමාබන්ධන පැමිණ වීමෙන් සිදුවන අයහපත් ප්‍රතිඵලත් සටහන් කළ කුමාරගම, සිය මිතුරු කිව්වර සුගුණපාල සමරසේකර වෙත 1942.07.31 දා පුත්තලමේ සිට ලියා යැවූ ලිපියේ 05 පිටුවේ එන සඳහනක්, කවිය හා කවියාගේ සමාජ භූමිකාව පිළිබඳ ඔහුගේ මතවාදය පැහැදිළි කරයි.

'ජන සමාජයේ එක් ස්ථානයක් පිරවීම කවියාගේ යුතුකමකි. එසේ වූ විට කවියා ලෝකයේය. සැනසීම සා සාමය සොයා සමාජයෙන් බැහැරව නිල් ලෝකය තුළට පිවිසීමට කවියා ලෝකයට අයත් නැත. සාමාන්‍ය මිනිසාට අභිමත වූ භෞතික සුවයට නොඇැලී කළකිරුණු විට කවියා ලෝකයේ නොවේ. ඊට වඩා උසස් ස්ථානයකය. තමා මිනිස් ලොව සිටියදී වල් වැදී හුදකලා ජීවිතයත් ගතකිරීමෙන් කවියාගෙන් ලොවට ඇතිවන සේවයක් නැත. කවියා සමාජ සේවකයෙක්ය - සමාජ ශෝධකයෙක්ය. සමාජයේ සුවයක් නොමැති බව දැන දැනද, නිල්ලෝකයේ තමාව අභිමත සුවය ඇති බව දැන දැන ද කවියා සමාජයෙන් බැහැර වුවද නැවතත් සමාජයටම පිවිසෙයි. මේ කවියාගෙන් ඇතිවිය යුතු සේවයයි.'

කවිය හා කවියා පිළිබඳව කුමාරගමගේ විචාර සංකල්ප මෙබඳු තැනෙකදී මිස ප්‍රකාශයට පත් වී නැති විටෙක ඔහු පළ කරන මේ අදහස් බෙහෙවින් වැදගත් වේ. කවියා සමාජ සත්ත්වයෙකැයි ඔහු පළ කරන මතය සුවිශේෂ ආස්ථානයකි. 'නිල් ලෝකය' පිළිබඳ ඔහුගේ අදහස්, 'එකතු කළ කවි' සංස්කාරකවරුන් සඳහන් කරන කුමාරගමගේ ගතානුගතික හා සාම්ප්‍රදායික අවධියට අදාළය. සැබැවින් ම මුල් යුගයේ ඔහුගේ රචනා සාම්ප්‍රදායික අත්දැකීම්, සාම්ප්‍රදායික පරිකල්පනයෙන් සහ කාව්‍යත්තීන්ගෙන් සැරසුණු නොගැඹුරු වූත් සමාජයීය අගයෙන් හීන වූත් ඒවාය. 'නිල් ලෝකය' යනුවෙන් ඔහු හැඳින්වූයේ මායාවී, කල්පනික, සිහින පරිසරයක් නම් කුමාරගම කවියා සයවසරක් ඇවැමෙන් ඉන් එහෙර වූ බව පෙනේ. පසු කාලීනව නිමවූ බොහෝ රචනාවල 'කල්පනාලෝක' නොවූ බැවිනි.

කොළඹ යුගයේ දෙවන පරපුරේ තමාගේ සම කාලීන කවීන් බොහෝ දෙනෙකු රොමැන්ටික් ප්‍රවණතාවට හසුවී, සොබා දහම, ළමා කාලය හා ලේඛය උත්කර්ෂයෙට නගද්දී, ඊට සවේතනික හා දිව්‍යමය හැඩරුවක් ලබා දෙද්දී, කුමාරගම එසේ නොකළේ, නො එසේ නම් අසුවෙන් එසේ කළේ මක් නිසාද? එමෙන්ම, සමාජයේ පැතිර පවත්නා දිළිඳුකමත් ජනතා පීඩනයත් ගැන කීවද, ඊමත්තේ උඩින් උඩින් අඩි තබා ගිය කවීන් අතරින් ඔහු තිරසාරව අවි තබා ගැඹුරින් සමාජය නිරූපනය කළේ කෙසේද? ස්වකීය අත්දැකීම් නිසාම ලද පරිනතියත්, විශ්ව සාහිත්‍ය ඇසුරින් වඩාගත් ව්‍යුත්පත්තියත්, ඔහු සතු වූ විශිෂ්ට කවි ශක්තියත් නිසාය.

සැබැවින්ම කුමාරගමද රොබෑන්ටික් සංකල්පවල බලපෑමට ගොදුරු නොවූවාම නොවේ. ඔහු 1941.04.20 දින සිය මිතුරු සුගුණවෙල සමරසේකර කවියාට පුත්තලමේ සිට යැවූ ලිපියේ මෙසේ සඳහන් කරයි. (බලන්න පිටුව 05 - පරිශිෂ්ටය)

'ෂේක්ස්පියර් ගේ "Tongues in Trees, books in running brook, sermans in stones, and good in everything" යන්නෙහි රස දැකීමටත්

මඩවගුරකින් මතු වෙන	දේසනාවෙකී
නදියෙන් විදි මිස පෙම්	තවනාවකී
හෙදියක දිවිය සැපමුසු	වේදනාවකී
කවියකු පිට එතුමින්	වාසනාවකි.

විමලරත්න කුමාරගම (1919 - 1962) සිය හතළිස් හතර හැව්රිදිදී ජීවිතයෙන් වසර විසි හතරක්ම කවිය සමඟ අවිඝෝජනීයව බැඳෙමින් දිවි ගෙවුවෙකි. 1935 වසරේදී සිය සොහොයුරියගේ විසෙ-ව් නිසා හටගත් සංවේදනා 'සංවේග වේදනා' නමින් කවි පොතකට ගොනු කරමින් තම මුල්ම කවි ලිව්ම ඇරඹූ හෙතෙම, හතළිස් හතර වන විය සපුරන්ට දින දහ අටක් තිබියදී, 1962 දෙසැම්බර් 30 දා මඟනුවර රෝහලේදී සමුගෙන යන්නට දින කීපයකට පෙරද කවි ලියුවේය. දිනපොතේ ලියූ කවි අතර ඔහුගේ අවසන් කවිය හමුවන්නේ දෙසැම්බර් 17 දා ය.

යන්නෙහි රස නොදැක්මටත් හේතුව කුමක්ද?

Jome the meanest flower that flows can give
Thoughts that do often lie too deep for tears. යන්නෙහි කවිත්වය දැකීමටත් .....

'වැඩිවිය බලායන බිඳිඳුගෙ සිනා	මත
අඩියෙන් අඩිය දුක් රහසක් කවා	ඇත
වැඩි පඳ කුමට කටු අකුලක නිවා	සිත
පොඩි පෙඳ පඳුර මට කඳුළට පවා	ඇත

යන්නෙහි රහසක් හෝ ගැඹුරක් හෝ කවිත්වයක් නොදැකීමේ රහස කුමක්ද?

ඉහත ඉංග්‍රීසි රචනාවල පදාඅපදින පරිවර්තන නොවූවද ඉන් සම්පිත ආභාසයක්, උත්තේජයක් කුමාරගම නිමැවූ එකී කවි පාඨක - විචාරක සැකිල්ලට ලක් නොවීම ගැන කවියාගේ කළ කිරීම හා කනස්සල්ලද ඔහු සටහන් කොට තිබේ. සැබැවින්ම එම ඉංග්‍රීසි රචනාවන්හි දක්නා, හුදු නොවැදගත් භාවයෙහි ඇති ගැඹුර. සූක්ෂමාත්මතාවෙන් ග්‍රහනය කිරීම, එය මහෝක්තියක් බවට පත් කිරීම වෙනුවට බොහෝ සිංහල කවීන් අතින් සිදුවූයේ, ගමේත්, දිළිඳුකමේත් සුන්දරත්වය පුන පුනා කියනු පිනිස එය වරදවා වටහා ගැනීමය. එහෙත් කුමාරගම එබඳු අල්පෝක්ති, යථාර්ථ .... වත් වූද, ගැඹුරු වූද කාව්‍යමය මහෝක්තීන් බවට පත් කොට රොමැන්ටික් ප්‍රවනතාවට අවනත වීමේ අනතුර ජයගත්තේය.

කුමාරගම, භාෂා ඥානය, ප්‍රතිභාව සංවේදිතාව සහ තියුණු නිරීක්ෂණ ශක්තිය පමණක් ඇති කවියකු වූයේ නැත. ඔහු සිය ව්‍යුත්පත්තිය වර්ධනය කරගත් අයුරුද කදිමය.

1942.07.31 දින ඔහු සිය මිතුරු සුගුනපාල සමරසේකර කවියාට ලියූ ලිපියෙහි, මුව දෙනකට ලැබුණු පැටවකුගේ මිය යෑම ගැන හේතු පළ කරමින් ඉංග්‍රීසි වෝඩ් ග්‍රන්ථයක පාඨයක් ඉදිරිපත් කරයි. එහි සරළ අදහස මෙවැන්නකි.

'ගර්භනීභාවය කායික සංවර්ධනයකි. එහෙත්, කෘත්‍රිම ක්‍රම මගින් ජීවිතය හා ජීවිතයේ සක්‍රියභාවය ව්‍යාධවේදී කරුණක් බවට පත් වේ.

කවියකුට විවිධ විෂයයන් හා අදාළ දැනුමක් තිබීම ලෝක විෂය පිළිබඳ ඔහුගේ සිතිවිලිවල පරිධිය විශාල කරන්නකි. කුමාරගම ඉදිරිපත් කරන මේ අදහස ස්වාභාවිකත්වයට එරෙහිව විද්‍යාව හා තාක්‍ෂණයත් කාර්මිකරණයත් විසින් එදා ගෙන ගිය අරගලයට රොමැන්ටික්වාදීන් දැරූ අදහසට එකඟතාව පළකිරීමකි.

ස්වාභාවික ආහාර හා ඖෂධ, සොයා යමින්, සොබාදහමේ කුලපතාව0 රැක ගන්නා පරිසර විෂවක් දියුණු වී ඇති අද දවසේ අවම තාක්‍ෂණයක්, පිළිබඳව කතා කළ ද එදා එබන්දක් නොවූ බවද සිහි කළ මනාය. 'අයියනායක' කවි පෙළේ දී 'මොළයයන් තමා දෝනසුයේ සුවය වැනසුසේ' ඔහු මේ පිරිස සැරසීමට නුවන් වලින්' යන යෙදුම් වලින් ද කුමාරගම අදහස් කළේ ප්‍රකෘතිය සියල්ලටම වඩා උතුම් බව මෙන්ම නව ඥානය - දැනුම එකී උතුම් බව වනසන බවය. එය ද රොමැන්ටික් වාදී කවීන්ට අනුගත වීමකි. එහෙත් නිවැරදි ඥානයත් දැනුමත් ප්‍රකෘතියට හෝ මිනිසාට හෝ සතුරු නොවන වග හෙළිදරව් වන විට කුමාරගම අප හැර ගොසිනි.

මතු සම්බන්ධයි